35

## මුහුණුපොතෙන් සිංහල භාෂාවට එක් වූ නව්‍ය ව්‍යවහාරයන්හි බලපෑම

**ලක්මාලි, ජී. ඩී. ඩබ්.**[1]

වර්තමානයේ සන්නිවේදනයේ දී විවිධ සමාජ මාධ්‍ය භාවිත කරන ආකාරය හඳුනා ගත හැකි ය. YOUTUBE, TWITTER, GOOGLE PLUS වැනි සමාජ මාධ්‍ය අතර බොහෝ පිරිසක් භාවිත කරන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් මුහුණුපොත හැඳින්විය හැකි ය. විශේෂයෙන් ම තරුණ පරපුර අතර මෙම මාධ්‍ය බහුල වශයෙන් භාවිත වන ආකාරය දැකගත හැකි ය. දිනෙන් දින මුහුණුපොත භාවිත කරන පිරිස් ඉහළ යෑමක් දැකගත හැකිවන්නා සේ ම එමඟින් භාෂාවට එක්වන නව්‍ය ව්‍යවහාර ද වැඩි වී ඇති අයුරු ද හඳුනා ගත හැකි ය. මෙලෙස එක්වන නව්‍ය ව්‍යවහාර හේතුවෙන් භාෂාව පරිහානියට පත්වන බව බොහෝ පිරිසකගේ මතය වේ. එසේ වුව ද මුහුණුපොත මඟින් සිංහල භාෂාවට එක්වන මෙම නව්‍ය ව්‍යවහාර භාෂාවේ උන්නතිය කෙරෙහි ද බලපාන බව පැවසිය හැකි ය. ඒ අනුව මුහුණුපොත මඟින් සිංහල භාෂාවට එක්වන මෙම නව්‍ය ව්‍යවහාර භාෂාවේ උන්නතිය කෙරෙහි මෙන් ම අවනතිය කෙරෙහි කෙසේ බලපා තිබේ ද යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම පර්යේෂණය සම්මුඛ සාකච්ඡා අසුරින් කරන ලද අධ්‍යයනයකි. එහි දී 2016 ජනවාරි මාසයේ සිට නොවැම්බර් දක්වා කාල පරාසය තුළ මුහුණුපොත භාවිත කරනු ලැබූ පුද්ගලයින් පිරිසක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් තොරතුරු රැස් කරන ලදි. මෙහි දී පුවත්පත්, සඟරා, අන්තර්ජාලය මඟින් තොරතුරු රැස් කිරීම සිදු විය. එහි දී මුහුණුපොත මඟින් සිංහල භාෂාවට එක්වන නව ව්‍යවහාර භාෂාව කෙරෙහි බලපාන ආකාරය සාධක ඇසුරින් විධිමත් අධ්‍යයනයකට ලක් කෙරෙයි.

ප්‍රමුඛ පදඃ අවනතිය, උන්නතිය, නව ව්‍යවහාර, මුහුණුපොත, සිංහල භාෂාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*